**සීමා නිර්ණය කොමිෂන් සභාව**
**2020 වර්ෂයේ දෙවන කාර්තුවේ කාර්ය සාධන වාර්තාව**
**2020 අප්‍රේල් 01 සිට 2020 ජූනි 30 දක්වා**

## 1.0 පසුබිම

සීමා නිර්ණය කොමිෂන් සභාව 2015.11.13 දින ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 41B හා 95(1) ව්‍යවස්ථාවන්ට අනුකූලවය. අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාවේ ධූර කාලය 2018.11.13 දින අවසන් වූ බැවින් එදින සිට වසර 3 ක කාලයක් සඳහා කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ආචාර්ය කේ. තවලිංගම් මහතාද සාමාජිකයකු ලෙස ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මියද නැවත පත් කරන ලද අතර, 2018.08.24 වන දින සිදුවූ මහාචාර්ය එස්.එච්. හස්බුල්ලා මහතාගේ අභාවයෙන් හිස් වී තිබූ සාමාජික තනතුර සඳහා 2019.03.11 වන දින ඒ.එම්. නහියා මහතා පත් කරන ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථා වලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් කියැවේ. කෙසේ වුවද අනිකුත් කොමිෂන් සභා සම්බන්ධයෙන් මෙන් නොව මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් නොවේ.

- කොමිෂන් සභාවේ කාර්යයන්
- කොමිෂන් සභාවේ බලතල

ආරම්භයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉඟිකරන ලද අදහස වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරන අවස්ථාවේදී හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන අවස්ථාවේදී තනි සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවීමට හා එහි වගකීම් භාරය විස්තර කරන විට සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණය කිරීම න්‍යායානුගත කිරීමට කටයුතු කරන බවය.

## 2.0 **දැක්ම**:- සදාචාරාත්මක හා සාධාරණ මූලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ටත්වය කරා ළඟා වීම

**මෙහෙවර-**:ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස හා සදාචාරාත්මක ලෙස, කාර්යක්ෂමවද, පාරදෘශ්‍යතාවයෙන් යුක්තවද, විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරීම.

**අරමුණු**

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරීම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරීම.

- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරීමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරීම.

- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.

- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

## 3.0 ප්‍රතිපත්තිමය කරුණු

### 3.1 ක්‍රියාකාරී සැලැස්ම

2019 වර්ෂය තුළදී අපේක්ෂිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු නොවීය. එබැවින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. කෙසේ වුවද පහත ක්‍රියාකාරකම් ඇතුළත් කර 2020 ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදි. (පළමු කාර්තු වාර්තාවේ ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.)

1. සැලසුම්කරණය හා පුහුණුව
2. තොරතුරු එක් රැස් කිරීම(පරිපාලන ඒකක හා පළාත් පාලන ආයතන පිහිටුවීමට අදාළ සියලුම ගැසට් නිවේදන එකතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.)
3. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහණය හා ඉඩකඩම් පිළිබඳ ප්‍රමුඛතා පෙරදැරිකොට පසුගිය පාර්ලිමේන්තු ඡන්ද විමසීම් හා බැදි සීමා නිර්ණය වාර්තා විශ්ලේෂණය කිරීම
4. පරිපාලන කොට්ඨාස වල සීමා පිළිබඳව අධ්‍යයනය
5. පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීම පිළිබඳ අධ්‍යයනය
6. වර්තමානයට ගැලපෙන වාර්තා / ලේඛනාගාරයක් සකස් කිරීම හා ලේඛනවල මෘදුකාංග පිටපත් සකස් කිරීම

### 3.2 පළාත් සභා සඳහා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම

2017 පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත 2017.09.20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි. 2017.10.04 දින ජනාධිපතිවරයා විසින් මේ කාර්යය සඳහා සීමා නිර්ණය කමිටුවක් පත්කරන ලදි. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් දෙදෙනාද මෙම කමිටුවේ සාමාජිකයන් බවට පත් කරන ලදහ. සම්පූර්ණ කරන ලද වාර්තාව 2018.02.19 වන දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාට භාරදෙන ලදි. එය 2018.03.06 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදි. 2018.08.24 දින එම වාර්තාව විවාදයට පාත්‍ර විය. ඉන් පසු එය සමාලෝචන කමිටුවකට යොමු කරන ලදි. වාර්තාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව ගන්නා ඊලඟ පියවර පිළිබඳව සීමා නිර්ණය කොමිෂන් සභාව අවධානයෙන් සිටී.

## 4.0 ගත වූ මාස තුන තුළ කාර්ය සාධනය

### 4.1 රැස්වීම්

2020 අප්‍රේල් මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ රැස්වීම **Covid 19** වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. එබැවින් මෙම කාර්තුව තුළ පරිපාලන හා ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා පහත පරදි රැස්වීම් දෙකක් පමණක් පවත්වන ලදි.

48 වැනි රැස්වීම - 2020.05.27
49 වැනි රැස්වීම - 2020.06.25

නිරෝධායන පනතේ නියමයන්ට අනුව, රට තුළ හා විශේෂයෙන් බස්නාහිර පළාතේ ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් 2020.03.16 දින සිට 2020.05.11 දක්වා කාලය තුළ කාර්යාලය වසා තැබීමට සිදු වූ අතර, හැකි සෑම අවස්ථාවක දීම දුරකථන හා අන්තර්ජාල පහසුකම් හරහා කටයුතු කරන ලදී. මෙම කාලය තුළදී අත්‍යාවශ්‍යම නිලධාරීන් කාර්යාලයට පැමිණ අවශ්‍යතාවය අනුව රාජකාරී ඉටු කරන ලදී.

### 4.2 සීමා නිර්ණය හා ඊට අදාළ ගැටලු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

සීමා නිර්ණය මාතෘකාව හා ඊට අනුශාංගික වූ ගැටලු පිළිබඳ මහජන අවබෝධය ඉහළ නංවාලීම සඳහා පුවත්පත් වලට ලිපි සැපයීමට හා කොමිෂන් සභා සාමාජිකයන්ගේ සම්පත් දායකත්වයෙන් වෘත්තිකයන්ගේ සංවිධාන සාමාජිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැත්වීමට සීමා නිර්ණය කොමිෂන් සභාව සැලසුම්කර ඇත.

මෙහිදී ප්‍රධාන වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය, මැතිවරණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා සුදුසු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් තිබුණි. පසුගිය කාර්තුව තුළ දී දිස්ත්‍රික් පරිපාලන නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් සහ **Covid 19** වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ සටහන් සංවිධානය සඳහා ගැටලු මතුවිය. ඒ අනුව එම වැඩසටහන් දින නියමයක් නොමැතිව කල් දැමීමට සිදුවී ඇත.

### 4.3 වර්තමාන ජාතික පරිපාලන ක්‍රමය තුළ බලපවත්වන භූගෝලීය මායිම් පිළිබඳ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රමය තුළ දැනට බලපවත්වන භූගෝලීය මායිම් ඉතා කඩිනමින් යථායෝග්‍ය ලෙස සකස් කළ යුතු බව සිය වසර හතරක සේවා කාලය තුළ සීමා නිර්ණය කොමිෂම විසින් අවබෝධ කොට ගෙන ඇත. සීමා නිර්ණය කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ආචාර්ය බණ්ඩාරනායක විසින් මේ පිළිබඳ කෙටුම්පත් වාර්තාවක් සකස් කරන ලදුව 2020.06.25 දින සීමා නිර්ණය කොමිෂන් සභා රැස්වීමේදී එය සාකච්ඡා කරන ලදි. මෙහිලා දැනට පවතින ගැටළු හා එම ගැටළු විසඳා ගන්නා ආකාරය විශ්ලේෂනාත්මකව හා සවිස්තරව දැක්වෙන වාර්තාවක් " ශ්‍රී ලංකාවේ ග්‍රා.නි.කො. මායිම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් යථායෝග්‍ය ලෙස නිර්ණය කිරීම සඳහා ක්‍රමවේදයක්" යනුවෙන් සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සකස්කොට ඇති අතර, එය අදාල බලධාරීන්ට ඉදිරිපත් කිරීමට නියමිතය. මේ යෝජිත ක්‍රමවේදය අනුව ජන සනත්වයට හා භූවිෂමතාවට ගැලපෙන පරිදි ජනගහණය හා භූමි ප්‍රදේශය පිළිබඳ ග්‍රා.නි. කොට්ඨාසය පැහැදිලි වගකීම් දරන තත්වයට පත්වන බැවින් සෑම ග්‍රා.නි. කොට්ඨාසයක්ම වඩාත් සුබනම්‍ය ලෙස හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කළහැකි වනු ඇත. (ඇමුණුම 01)

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ මැනුම් විද්‍යාව හදාරන ශිෂ්‍යයෙකු විසින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මායිම් සලකුණු කිරීම තම අවසන් ව්‍යාපෘතිය ලෙස තෝරාගෙන තිබූ අතර එහි අධීක්ෂණ කටයුතු සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති අචාර්ය කේ.තවලිංගම් මහතා විසින් ඉටු කරන ලදි.

එම ශිෂ්‍යයා විසින් එම ව්‍යාපෘතිය අචාර්ය කේ.තවලිංගම් මහතාගේ අධීක්ෂණය යටතේ සාර්ථකව නිමා කර අදාල වාර්තාවේ පිටපතක් කොමිෂන් සභාව වෙතද භාර දී ඇත.

## 5.0 පරිපාලනමය හා මූල්‍ය කරුණු

### 5.1 සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා කාර්යාල පහසුකම්

2016 වර්ෂයේ සිට සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කුලී ගෙවීමකින් තොරව පවත්වාගෙන යාමට මැනුම්පතිවරයා ඉඩ සලසා දී ඇත.

**වර්තමාන කාර්යාලයීය ලිපිනය**
සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගෙඩනැගිල්ල
තැ.පෙ.506
කොළඹ 05

### 5.2 ප්‍රවාහන කටයුතු

මහා භාණ්ඩාගාරය විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවට 2016 වසරේදී වාහන 2ක් ලබා දෙන ලදි. CAP 7180 දරණ වාහනය ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචි කර එනමින් රක්ෂණය කර ඇති අතර එය සභාපතිවරයා සඳහා වෙන් කර ඇත. දෙවැනි මෝටර් රථය CAR 0347 ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුයුක්ත කරන ලදි. මෙම වාහන සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සියලුම ප්‍රවාහන කටයුතු සඳහා තවදුරටත් යොදාගනු ලැබේ.

### 5.3 සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්යභාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

| තනතුර | මට්ටම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෙෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරි | ජ්‍යෙෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | රා.පරි.ච. 6/2006 |
| පරිපාලන නිලධාරි | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතියික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතියික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

2020.06.30 දින වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

| තනතුර<br>a -අර්ධ කාලීන | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 [a] | - |
| ගණකාධිකාරි | 01 | 01 [a] | - |
| සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | 02 | 02 | - |
| එකතුව | 15 | 10 | 05 |

වැඩ බලන ගණකාධිකාරි ලෙස කටයුතු කල එස්.ටී.බුලත්සිංහල මහතාගේ පත්වීම් කාලය 2020.03.31 දිනෙන් අවසන් වූ අතර, 2020 අප්‍රේල් 01 දින සිට තවත් වසරකින් ඔහුගේ පත්වීම් කාලය දීර්ඝ කරන ලදි.

කාර්යාල කාර්ය සහයක ඩබ්.ඒ.ඩී.වික්‍රමාරච්චි මහත්මිය 2019.10.24 දින සිට වැටුප් සහිත, අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු ලබාගෙන සිටී.

මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි සභාපතිවරයාගේ එකඟතාව මත සම්බන්ධීකරණ ලේකම් නලින් සේමගේ මහතා 2020 පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීමට මැතිවරණ කොමිෂන් සභාව වෙත 2020.03.03 දින සිට පූර්ණකාලීනව නිදහස් කරන ලදි.

තවද රියදුරු ඒ.එච්.ඩී.දිලංජන ද සිල්වා මහතා සහ රියදුරු ඩී.ජී.කැලුම් මහතා 2020 පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරී සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත 2020.03.12 සහ 2020.03.17 යන දිනයන්හි සිට තාවකාලිකව නිදහස් කිරීමට කටයුතු කරන ලද අතර රියදුරු ඩී.ජී.කැලුම් මහතා 2020.05.27 දින සිට නැවත සීමා නිර්ණය කොමිෂන් සභාවේ සේවය සඳහා වාර්තා කර ඇත.

## 6.0 නොවිසඳුනු කාරණා

සීමා නිර්ණය කොමිෂන් සභාව සිය 2018 සහ 2019 වර්ෂයන්හි සහ 2020 වර්ෂයේ පළමු කාර්තුවේ කාර්ය සාධන වාර්තාවන් මඟින් ඉස්මතුකොට දක්වන ලද නොවිසඳුනු ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී. ඒවා නම්,

1. පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවට නියමිත කාර්යභාරයක් නියම වී නැත. මේ අතර ශ්‍රී ලංකාවේ පවත්නා අනපනත් හා කාර්ය පටිපාටි කිහිපයක් මඟින් මැතිවරණ කොට්ඨාස හා පරිපාලන මට්ටම්වල විවිධාකාරයේ සීමා නිර්ණයන් සිදු වෙමින් පවතින අතර මෙම ප්‍රශස්ත ප්‍රතිලාභ ලැබීමට නම් ඒ සියල්ල යථායෝග්‍ය ලෙස සිදු කළ යුතුය.

   එවන් තත්වයක් ඇති කිරීමේ අරමුණින්,

   - 2016 ජූලි මාසයේදී "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය භාරය පුළුල් කිරීම යන මැයෙන් යුතු ප්‍රතිපත්ති යෝජනාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

   - එම යෝජනාවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවේ රාජ්‍ය සේවය පිළිබඳ පාර්ලිමේන්තු අනු කමිටුවේ ලේකම්වරයා වෙත, සභාපතිවරයා විසින් සකස්කරන ලද " නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සකස්කරන විට සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු කාරණා." යනුවෙන් වූ ඇමුණුමක්ද සහිතව 2016 ජූලි මස ඉදිරිපත් කරන ලදි. මෙම යෝජනාව අනු කමිටුවේ සැලකිල්ලට භාජනය විය.

   - නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කරන විටදී සැලකිල්ලට භාජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය කිරීම සඳහා වූ මූලධර්මය ප්‍රතිපත්ති රාමුව" යන මැයෙන් සකස් කරන ලද ලිපියක් 2016 ඔක්තෝබර් මාසයේදී එහි සභාපතිවරයා වන ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යවන ලදි.

   සීමා නිර්ණය කොමිෂන් සභාවට මෙම යෝජනා සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.

2. සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීමේ අවශ්‍යතාව මත ඒ සඳහා 2017.10.18 දින හා 2018.10.18 දින ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති විග්‍රහ පත්‍රිකාව සහ අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත පිළිබඳ නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගෙන ඇත. ඒ අනුව ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකදී සීමා නිර්ණය කොමිෂන් සභාවට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කරන බවට ජනාධිපති ලේකම්වරයා විසින් අංක PS/AC/CCU/01/03/05 හා 2019.06.23 දිනැති ලිපියෙන් දන්වා ඇත.

## ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් යථායෝග්‍ය ලෙස නිර්ණය කිරීම සඳහා වූ ක්‍රමවේදයක්

### විධායක සාරාංශය

රටේ ජනතාව වෙනුවෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහාද, සම්පත් සපයාදීම සඳහාද අධ්‍යාපනය, සෞඛ්‍ය, පාරිසරික ආරක්ෂාව, නීතිය ක්‍රියාත්මක කිරීම ආරක්ෂාව සැලසීම වැනි සේවාවන් සලසාදීම සඳහාද, ශ්‍රී ලංකා රජයටත් ජනතාවටත්, පෞද්ගලික අංශයටත් විශ්වසනීය හා කාලානුරූප තොරතුරු අවශ්‍යය. දැනට ශ්‍රී ලංකාවේ තොරතුරු සැපයෙනුයේ ජාතික පරිපාලන ක්‍රමය මඟින් වන අතර ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමේදී ඒ සඳහා භාවිත කරන සීමා මායිම් එකිනෙක වෙනස්ය. කාර්යක්ෂම ජාතික පරිපාලන ක්‍රමයක් තුළ ඒ ඒ ප්‍රදේශ බෙදිය යුත්තේ පරිපාලනමය වශයෙන් කළමනාකරණය කළ හැකි වූ ඉඩම් ඒකක ගණනාවක් ඇතුළත්වන ආකාරයටය. එවිට ඒකක වලින් තොරතුරු එක්රැස්කර ගැනීමද, සේවාවන් සැපයීමද ක්‍රමානුකූලව හා කාර්යක්ෂමව ඉටුකළ හැකිය. මෙසේ හඳුනා ගනු ලබන බිම් ඒකකවල විශාලත්වය එම ප්‍රදේශයේ ජනගහණ ව්‍යාප්තියද, භූමියේ හැඩය, කඳුබිම්, ජලභූමි, වනගහණය, ප්‍රවේශ මාර්ග වැනි භූ ලක්ෂණද පිළිබිඹු කරන්නක් විය යුතුය. එවැනි ජාතික පරිපාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට නම් දැනට ශ්‍රී ලංකාවේ පවත්නා ජාතික පරිපාලන ක්‍රමයෙහි පවත්නා ගැටළු හඳුනා ගැනීමත් එම ගැටළු නිරාකරණය කිරීමත් සඳහා සමාලෝචනයක් ඉටු කළයුතුව පවතී.

ශ්‍රී ලංකාවේ ජාතික පරිපාලන ක්‍රමය තුළ පවත්නා කුඩාම ඒකකය ග්‍රාම නිලධාරී කොට්ඨාසයයි. ග්‍රාම නිලධාරී කොට්ඨාස සමූහයක් එක්කොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිහිටුවා ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් යුක්තව විශාලතම පරිපාලන ඒකකය වන පරිපාලන දිස්ත්‍රික්කය සකස් වී ඇත. දිවයින පුරා ජනගහණ හා පාරිසරික තොරතුරු සපයා ගැනීමට උපයෝගී කරගන්නේ මෙම ජාතික පරිපාලන ක්‍රමයයි. එම තොරතුරු සපයන කුඩාම ඒකකය ග්‍රාම නිලධාරී කොට්ඨාසයයි. ඉන් අනතුරුව එක්රැස් කරන තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික්ක හෝ පළාත් මට්ටමින් අවශ්‍යවන ආකාරයට සමූහගත කරනු ලැබේ.

ග්‍රාම නිලධාරී කොට්ඨාසයක පරිපාලනය පිළිබඳ වගකීම දරනුයේ ග්‍රාම නිලධාරීවරයාය. අද ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 14,022 ක් පවතී. අවසන්වරට 2012 වර්ෂයේදී පවත්වා ඇති ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගනණය අනුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයක ජනගහණ හා භූමි ප්‍රමාණ සාමාන්‍යය පිළිවෙලින් පුද්ගලයන් 1,452 ක් හා වර්ග කි.මී. 4.7 ක් වේ. කෙසේ වුවත් එක් එක් දිස්ත්‍රික්ක වල එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකින් ආවරණය වන ජනගහණය හා භූමි ප්‍රමාණයන් හි දක්නට ලැබෙනුයේ අතිවිශාල පරස්පරතාවන්ය. වර්ග කි.මී.516 කින් යුත් (හම්බන්තොට) ග්‍රාම නිලධාරී කොට්ඨාසය මෙන්ම ව.කි.මී. 0.04 කින් යුත් (අම්පාර, මඩකලපුව) ග්‍රාම නිලධාරී කොට්ඨාසයද ඇත. ජනගහණය පුද්ගලයින් 28003 වන ග්‍රාම නිලධාරී කොට්ඨාස (කොළඹ) මෙන්ම පුද්ගලයන් 100 කට අඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසද ( මඩකලපුව, යාපනය, කිලිනොච්චිය, මුලතිව්, පොලොන්නරුව, ත්‍රිකුණාමලය) දක්නට ලැබේ.

ඊළඟ මට්ටමේදී ප්‍රාදේශීය ලේකම්වරයා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලනය සම්බන්ධයෙන් වගකියයි. දැනට ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ඇතුළත්වන ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණනෙහි සාමාන්‍යය 42 කි. ජනගහණයේ හා භූමි ප්‍රමාණයේ සාමාන්‍යය පිළිවෙලින් 61,509 හා ව.කි.මී. 198 ක් වේ. ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන, භූමි ප්‍රමාණය හා ජනගහණ ප්‍රමාණය ඒ ඒ දිස්ත්‍රික්ක වල එකිනෙක වෙනස්ය. පිළිවෙලින් ග්‍රාම නිලධාරී කොට්ඨාස 151 (නුවරඑළිය) සිට 5 (මොණරාගල) දක්වා ද, ජනගහණය පුද්ගලයින් 323,257 (කොළඹ) සිට 3824 (යාපනය) දක්වාද ව.කි.මී. 1,066 (මොණරාගල) සිට ව.කි.මී. 2.48 (අම්පාර) දක්වාද දක්නට ලැබේ.

තවද දිවයිනේ විශාලතම දිස්ත්‍රික්කය වන අනුරාධපුරය ව.කි.මී. 6,664 ක් වන අතර එය ව.කි.මී. 676 ක් වන කොළඹ මෙන් දසගුණයක භූමිප්‍රමාණයක පැතිර පවතී. සමතලා බිමක් සහිත ප්‍රවේශ මාර්ග පහසුව ඇති අධි නාගරික කොළඹ ජනගහණ ඝනත්වය වර්ග කි.මී. 1/ පුද්ගලයන් 3447 ක් වේ. එය දුරස්ථ

වූ වනගහණය පිරි ව.කි.මී. 1/පුද්ගලයින් 82 ක් වන මොණරාගල මෙන් 40 ගුණයකට වැඩි ප්‍රමාණයකි. ව.කි.මී. 1/පුද්ගලයින් 1,500 ක ජනගහණ ඝනත්වය ඇත්තේ මිලියන 2 කට වඩා ජනගහණයක් පවත්නා කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවලය. අනිකුත් දිස්ත්‍රික්ක 18 ක ජනගහණ ඝනත්වය ව.කි.මී 1/800 හා ව.කි.මී.1/100 අතර අඩු ප්‍රමාණයක පවතී. ඉතිරි දිස්ත්‍රික්ක 5හි ජනගහණය ව.කි.මී.1/100 ට වඩා අඩුය.

මෙම විචලායයන්ගෙන් පෙන්වනුයේ එක් ග්‍රාම නිලධාරීවරයෙකුට හෝ ප්‍රාදේශීය ලේකම්වරයෙකුට පාලනය කිරීමට ඇති ජනගහණ විශාලත්වය හා භූමි ප්‍රමාණය ඒ ඒ දිස්ත්‍රික්කවල පවත්නා ජනගහණයේ විශේෂිත අවශ්‍යතාවන් හා භූමියේ පිහිටීම අනුව වෙනස්වන බවය. වඩාත් යෝග්‍යවන්නේ එක් ග්‍රාම නිලධාරීවරයෙකුට ප්‍රාදේශීය ලේකම්වරයෙකුට හා අධ්‍යාපන, මහජන සෞඛ්‍යය, ආරක්ෂාව, නීතිය , සිවිල් ලියාපදිංචිය ජල සම්පාදනය, ප්‍රජා සෞඛ්‍යය, කෘෂිකාර්මික ව්‍යාප්තිය, වන විද්‍යා ව්‍යාප්තිය වැනි සේවා සපයන නිලධාරියෙකුට ප්‍රායෝගික වශයෙන් කළමනාකරණය කරගත හැකි ප්‍රමාණයකින් ජනගහන ව්‍යාප්තිය හා භූමි ප්‍රමාණය පැවතීමයි. ඕනෑම ග්‍රාම නිලධාරී/ ප්‍රාදේශීය ලේකම්/ වෙනත් සේවා කාර්යාලයකින් සේවය ලබන ඕනෑම පදිංචි කරුවෙකුට හදිසි අවස්ථාවකදී සාධාරණ කාලවේලාවක් තුළ ළඟාවීමට හැකිවන තරම් දුරකින් අදාළ සේවා ස්ථානය පිහිටා තිබීම අවශ්‍යය.

උදාහරණයක් වශයෙන් අධික ජනගහණ ඝනත්වයක් (ව.කි.මී.1/>1500 පුද්ගලයන්) පවතින ප්‍රවේශ මාර්ග පහසුකම් ඇති නාගරික ප්‍රදේශයක ග්‍රාම නිලධාරීවරයෙකුට කුඩා ප්‍රදේශයක ගෘහමූලයන් වැඩිපුර ප්‍රමාණයකට සේවය සැලසීමට සිදුවේ. අඩු ජන ඝනත්වයක් (ව.කි.මී.1/<100) සහ ගමන් පහසුකම් සහිත දුරස්ථ තැනිතලා ප්‍රදේශයක නම් ග්‍රාමනිලධාරීවරයාට සිදුවන්නේ විශාල භූමි ප්‍රදේශයක එහෙත් අඩු ගෘහ මූලයන් ප්‍රමාණයකට සේවාවන් (ජල ගැලීම්, නියගය, නාය යාම්, වන විනාශය, නීති විරෝධී ලෙස සතුන් දඩයම් කිරීම වැනි අවස්ථාවන්හිදී) සැලසීමටය. ගෘහ මූලයන් ප්‍රමාණය බෙහෙවින් අඩු කඳුකර හා වනාන්තර ගණන ජනගහණය තුනී ලෙස ව්‍යාප්ත වූ ප්‍රදේශයක පවත්නා ගමනාගමන දුෂ්තරතාවය නිසා කළමනාකරණය කළ යුතුවන භූමි ප්‍රමාණය අඩු වෙයි.

ග්‍රා.නි. කොට්ඨාස මෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ද ප්‍රාදේශීය ලේකම්වරයෙකුට ප්‍රායෝගිකව කළමනාකරණය කරගත හැකි ප්‍රමාණයට ජනගහණයේ විශාලත්වය සහ භූමි ප්‍රමාණයද ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාවද සකස්විය යුතුය.

ඉහත දැක්වෙන ආකාරයට ඒ ඒ දිස්ත්‍රික්කය තුළ පවත්නා ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල විශාලත්වයෙහි හා සංඛ්‍යාවන්හි වෙනස් කිරීම් කළ යුතුද යන්න සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ප්‍රායෝගික ක්‍රමවේදයකට අනුව අධ්‍යයනය කර තිබේ. දිස්ත්‍රික් මායිම්වල වෙනස් කිරීම් අවශ්‍ය ප්‍රදේශවල ජනගහණය හා භූ විෂමතා ලක්ෂණ සැලකිල්ලට ගෙන එම වෙනස් කිරීම් සිදු කිරීම සඳහා සැදුනාවූ ක්‍රමවේදයන් ද ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා සීමා නිර්ණය කොමිෂම විසින් සකස් කරනු ලැබ තිබේ.

මෙම ක්‍රමවේදය යටතේ ජනගහණයේ ඝනත්වය, භූමියේ ස්වභාවය, මුහුදු මට්ටමේ සිට උස ප්‍රමාණය, ප්‍රවේශ මාර්ගවල පවත්නා වර්තමාන තත්වය යන කරුණු සැලකිල්ලට ගෙන දිවයිනේ දිස්ත්‍රික්ක 25 පුළුල් වශයෙන් වර්ග 10 කට වර්ගීකරණය කළ හැකිය. ඒ අනුව එක් එක් වර්ගයට ගැලපෙන ග්‍රාම නිලධාරී කොට්ඨාසයක විශාලත්වය කවරේදැයි නිර්ණය කිරීම සඳහා සුදුසු වන දළ පදනමක් සකස් කරනු ලැබේ.

ඒ අනුව වර්ග කි.මී.1/ජනගහනය 1500 ට වඩා ඉහළ ප්‍රමාණය සහිත වර්ගයට ඇතුළත් වන්නේ තැනිතලා භූමියක් හා ගෘහ ප්‍රවේශ මාර්ග ඇති කොළඹ හා ගම්පහ යන දිස්ත්‍රික්ක පමණි. සෙසු දිස්ත්‍රික්ක 23 හි ජනගහණ ඝනත්වය පවතින්නේ ව.කි.1/800 ට අඩු ප්‍රමාණයකි. ඒ අතර දිස්ත්‍රික්ක 7ක් (ගාල්ල, යාපනය, කලුතර, මහනුවර, කෑගල්ල, මාතර හා නුවරඑළිය) ජනගහණ ඝනත්වය ව.කි.මී.1/400 හා ව.කි.මී.1/800 ප්‍රමාණයෙහි වන අතර ඒවාහි භූමි ඝනත්වය එකිනෙක බෙහෙවින් වෙනස්ය. ගාල්ල, යාපනය හා මාතර සාපේක්ෂ වශයෙන් තැනිතලා භූමි හා පහසු ප්‍රවේශ මාර්ග සහිත වන අතර කළුතර, මහනුවර,කෑගල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්ක කඳුකර භූමි හා දුෂ්කර ප්‍රවේශ මාර්ග සහිත වේ. එබැවින් යෝජිත වර්ගීකරණය යටතේ මෙම දිස්ත්‍රික්ක 7 පැහැදිලි වර්ග 4 කට බෙදීයයි.

තවත් දිස්ත්‍රික්ක 11 ක් (අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, හම්බන්තොට, කුරුණෑගල, මාතලේ, පොලොන්නරුව,පුත්තලම,රත්නපුර හා ත්‍රිකුණාමලය) ජනගහණය ව.කි.මී.1/100 හා ව.කි.මී.1/400 අතර වන අතර ප්‍රවේශ මාර්ග දුෂ්කර තත්වයේ පවතින මුත් ඒවායේ භූමි ස්වභාවය එකිනෙක බෙහෙවින් වෙනස් වේ. මඩකලපුව, පුත්තලම හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක තැනිතලා භූමි සහිත වන අතර අම්පාර, අනුරාධපුර, හම්බන්තොට හා පොලොන්නරුව දිස්ත්‍රික්ක තරමක් කඳුකර භූමි සහිත වේ. බදුල්ල, මාතලේ, රත්නපුර යන දිස්ත්‍රික්ක බෙහෙවින් කඳුකර සහිත වේ. එබැවින් යෝජිත වර්ගීකරණය අනුව මේ දිස්ත්‍රික්ක 11 වර්ග 3 කට බෙදිය යුතුවේ.

ඉතිරි දිස්ත්‍රික්ක 5 හි වනගහනය අධික වන අතර ප්‍රවේශ මාර්ග දූෂ්කරවේ. ජනගහණ ඝනත්වය ව.කි.මී.1/100 ට අඩුය. මොණරාගල දිස්ත්‍රික්කය කඳු සහිත වන අතර කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් හා වවුනියා තැනිතලා භූමි සහිත වේ. ඒ අනුව මේ දිස්ත්‍රික්ක 5 වර්ග 2 කට වෙන්කළ හැකිය. ඉන් මොණරාගල දිස්ත්‍රික්කය එක් වර්ගයකට අයත්වේ.

එක් එක් දිස්ත්‍රික්කවල දැනට තිබෙන ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව, යොජිත ක්‍රමවේදයෙන් දක්වන ඉහල හා පහල සීමාවන් සමඟ සසඳා බැලීමේදී දිස්ත්‍රික්ක 15 ක ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව නිසි පරාසය තුළ පවත්නා බව පෙනේ. අනිකුත් දිස්ත්‍රික්ක 10 තුළ පහසු මාර්ග ප්‍රවේශයන් ඇති අතර ඒවාහි තිබෙන ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව අතිශයින් වැඩිය. ඉහළ පරිපාලන කාර්යක්ෂමතාවක් ඇති කිරීම සඳහා මෙම දිස්ත්‍රික්ක 10 හි ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව නැවත සමාලෝචය කොට අඩු කිරීමට පුළුවන. තවද ග්‍රාම නිලධාරී කොට්ඨාස රැසක්ම ජනගහණ සංඛ්‍යාව හා භූමි ප්‍රමාණය යෝජිත සංඛ්‍යාවන් හා ප්‍රමාණයන් ඉක්මවා පවතී. විශේෂයෙන් දිස්ත්‍රික්ක 25 හිම ග්‍රාම නිලධාරී කොට්ඨාස 838 ක ජනගහන උපරිම සීමාව ඉක්මවා ඇති අතර දිස්ත්‍රික්ක 20 ක ග්‍රාම නිලධාරී කොට්ඨාස 253 ක් තුළ භූමි ප්‍රමාණයෙහි උපරිම සීමා ඉක්මවා ඇත. දිස්ත්‍රික්ක 8 ක් තුළ ග්‍රාම නිලධාරී කොට්ඨාස 15 ක ජනගහණ හා භූමි යන ප්‍රමාණ දෙකම ඉක්මවා ඇත. මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාස කඩා වෙන්කොට ඒසේ කඩන ලද කොටස් ඒවාට යාබදව පවතින කුඩා ග්‍රාම නිලධාරී කොට්ඨාස වලට එකතු කරමින් ඒ ඒ දිස්ත්‍රික්කවල යෝජිත ජනගහන හා භූමි ප්‍රමාණයට ගැලපෙන පරිදි නව ග්‍රාම නිලධාරී කොට්ඨාස ඇතිකළ හැකිය.

සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සකස්කරන ලද මෙම ක්‍රමවේදය අනුව ඒ ඒ දිස්ත්‍රික්කය තුළ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කළ හැකි ග්‍රාම නිලධාරී කොට්ඨාස සඳහා හඳුනා ගන්නා ලද ජනගහණ සංඛ්‍යාවට හා භූමි ප්‍රදේශයට ගැලපෙන පරිදි වර්තමාන ග්‍රාම නිලධාරී කොට්ඨාස ක්‍රමය මූලික යථායෝග්‍යකරණයකට ලක් කළ හැකි බව මෙහි සාරාංශ ලෙස දැක්විය හැකිය. දිවයිනේ පරිපාලනයෙහි හා සේවා සැපයීමෙහි ලා ඉහළ කාර්යක්ෂමතාවක් සාක්ෂාක් කරගැනීම සඳහා වූ ප්‍රාරම්භක ප්‍රකාශනයක් ලෙස මෙම ක්‍රමවේදය ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් සාකච්ඡා කොට පිළිගනු ලැබ ක්‍රියාත්මක කරනු ලබන්නේ නම් ඉදිරියේදී මෙහි ලා අවශ්‍යවන වෙනස් කිරීම් හා වැඩිදියුණු කිරීම් අවස්ථානුකූලව සිදුකළ හැකිය.